**වර්ගය:** අනිවාර්ය

**පාඨමාලා සංකේතය:** CHCU E3025

**මාතෘකාව:** සමය දර්ශනය සහ ක්‍රිස්තියානි ධර්මයේ වර්ධනය

**පූර්ව අවශ්‍යතා:** දෙවන ස්තරයේ CHCU විභාග සම්පූර්ණ කර තිබීම.

**අරමුණු සහ අභිප්‍රේතාර්ථ** මෙම විෂය ඒකකයෙහි මූලික අභිප්‍රේතාර්ථය වන්නේ වෙනත් විෂය පථවලින් සමය (අධ්‍යයනය) සඳහා යොදා ගන්නා පොදු ක්‍රමවේද පිළිබඳ පරිදර්ශනයක් ඉදිරිපත් කිරිම සහ ප්‍රධාන ක්‍රිස්තියානි චින්තකයන්ගේ මූලික දර්ශනය ඇතුලුව ක්‍රිස්තියානි ධර්මයේ වර්ධනය අධ්‍යයනය කිරීමය.

**ඉගෙනුම් ඵලඃ** මෙම විෂය ඒකකය හදාරා අවසාන කරන විද්‍යාර්ථීන්ට ඓහික හා ලෝකෝත්තර ආගම්වල මූලිකාංග හඳුනා ගන්නටත්, නූතන අධ්‍යයන විෂය පථ යොදා ගනිමින් සමය ප්‍රපංච විග්‍රහ කිරීමටත් හැකි වේ. එමෙන් ම ඉතිහාසය පුරා ක්‍රිස්තියානිය ගොඩනැගීමට ප්‍රධාන වශයෙන් දායක වූ දර්ශන ප්‍රවණතා (philosophical trends) සහ ක්‍රිස්තියානි ඉගැන්වීම් පිළිබඳ මතභේද හඳුනා ගැනීමට හැකි වනු ඇත.

**පාඨමාලා අන්තර්ගතයඃ**

**පළමු කොටස**

1. ඉතිහාසය පුරා ආගම් පිළිබඳ මත, සමය (අධ්‍යයනය) සඳහා යොදා ගන්නා ක්‍රමවේද, සමය දර්ශනය හැඳින්වීමඃ සමය දර්ශනයේ ස්වභාවය සහ භූමිකාව, ආගම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනඃ දරිද්‍රතාව වැනි මානව යථාර්ථ හා ආගම අතර සම්බන්ධතාව, ආගමික පිළිවෙත්, ශුද්ධත්වය සහ මිස්ටරි ආගම පිළිබඳ අධ්‍යයන. ආගම සහ මිනිස් ජීවිතය අතර සබඳතාව.

**දෙවන කොටසඃ**

1. නව ගිවිසුමෙහි කෙටි යෙදුම් ආකාරයෙන් ඉදිරිපත් කරන ලද ධර්මය. ඉන් අනතුරුව ඉදිරිපත් කරන ලද විශ්වාස ලක්ෂණ නමැති වඩා ක්‍රමානුකූල යෙදුම්. අපොස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

සහ නිසියානු කොන්ස්තන්තිනෝපල් විශ්වාස ලක්ෂණය පිළිබඳ පහත සඳහන් දෑ විද්‍යාර්ථීන් විසින් අධ්‍යයනයක් කළයුතු ව ඇත. එම විශ්වාස ලක්ෂණවල සම්භවය මුල් ශතවර්ෂවල සිට අද දක්වා එම විශ්වාස ලක්ෂණ භාවිත වූ ආකාරය සහ නිසියානු කොන්ස්තන්තිනෝපල් විශ්වාස ලක්ෂණයේ එක් එක් ධර්ම වගන්ති පිළිබඳ කෙටි රචනාවක් ලිවීමේ හැකියාව.

2. පහත සඳහන් චින්තකයින් පිළිබඳ දැනුම: ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට්, ටෙර්ටූලියන් ඔරිගන්, අයිරේනියස්, හිපෝහි අගොස්තීනු, තෝමස් ඇක්වයිනස්, ක්ලෙයාවෝහි බර්නාඩ්, මාටින් ලූතර්, ෆ්‍රිඩ්රිච් ෂ්ලයමහර්, ජෝන් හෙන්රි නියුමන්, පෝල් ටිලිච්, කාල් බාර්ත්, තෙයියාද් ද ෂාදැන්, කාල් රානර්.

3. විසිවන සියවසෙහි ක්‍රිස්තියානි සභාවන්හි බයිබලීය ජනවන්දනා සහ ධර්මෝපදේශක සම්ප්‍රදායයන්ගේ පුනර්ජීවනය.

4. ක්‍රිස්තියානි සභාවල සමාජ සැලකිල්ල:1891 දී ප්‍රකාශයට පත් කරනු ලැබූ "වෙහෙසෙන මිනිස්සු"(Rerum Novarum) නම් වූ සමාජ විශ්වලේඛනයේ අඩංගු පෞද්ගලික දේපල, සාධාරණ වැටුප්, සේවකයින්ට හා ස්වාමිවරුන්ට තිබෙන අයිතිවාසිකම් හා යුතුකම්. සංස්කෘතියේ සංවර්ධනය, දේශපාලන ප්‍රජාවේ දිවි පැවැත්ම, යුද්ධය සහ සාමය යන මාතෘකා පිළිබඳ ව දෙවන වතිකානු ජගත් මන්ත්‍රණ සභාවෙන් ප්‍රකාශිත වූ නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව පිළිබඳ උපදේශාත්මක ප්‍රකාශය අධ්‍යයනය කිරීම. ක්‍රිස්තියානි වගකීම සහ නිදහස් අරගලවලට ක්‍රිස්තියානි භක්තිකයින්ට කොතෙක් දුරට සහභාගි විය හැකිද යන තේමා පිළිබඳ ජගත් ක්‍රිස්තියානි සභා සම්මේලනයේ ප්‍රකාශන පිළිබඳ දැනුමක්.

5. කාන්තාව, පරිසරය හා සාමය පිළිබඳ ක්‍රිස්තියානි චින්තනය

**නිර්දේශිත කියවීම්:**

**පළමු කොටස**

Durkheim, E. (1998).*The Elementary Forms of Religious Life*. New York: tr. K.E. Fields, The Free Press.

Frazer, J. (1994).*The Golden Bough: A History of Myth and Religion* (abridged volume). London.

Galloway, G. (1945). *The Philosophy of Religion*. Tot Clark, Edinburg.

Houtart, F. – Lemercinier, G. (1985). *The Great Asian Religions and their Social Functions*. Louvain-la-Neuve.

Otto, R. (1959). *The Idea of the Holy: An Inquiry into the Non-Rational Factor in the Idea of the Divine and its Relation to the Rational*. Middlesex.

Pals, D.L. (1996). *Seven Theories of Religion*.New York:Oxford University Press.

Panikkar, R.(1978).*The Intrareligious Dialogue*. New York.

Smart, N. *The Religious Experience of Mankind*, Oxford: University Press.

Smart, N.(1992).*The World's Religions*.Cambridge: University Press.

Weber, M. (1963).*The Sociology of Religion*, tr. E. Fischoff, Boston.

**දෙවන කොටස**

Ford, D.F. (ed.).(1994). *The Modern Theologians*.Oxford:Blackwell .

Kelly, J.N.D. (1976). *Early Christian Creeds*. London:Longman.
McGiffert, A.C. (1954). *A History of Christian Thought*.(Vols. I-II),
Blackwell, NY.

McGrath, A.E. (1993). *The Blackwell Encyclopedia of Modern Christian Thought*, Blackwell, Oxford (relevant sections).

McGrath, A.E. (1998). *Historical Theology. An Introduction to the History of ChristianThought*, Blackwell, Oxford.

රොහාන්, ඩබ්ලිව්. (2013). *ක්‍රිස්තියානි චින්තකයෝ: ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබඳ විද්‍යාර්ථීන්ගේ විෂයානුබද්ධ ග්‍රන්ථයකි*, කොළඹ: ගොඩගේ.